# ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ නිලධාරීන් විශේෂ ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයේ ලකුණු පරිපාටිය

**ජ්‍යෙෂ්ඨතාවය** **(උපරිම ලකුණු 70)**

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ සක්‍රිය අවුරුදු 18 ක සේවා කාලය හා 1 ශ්‍රේණියේ වසර 05 ක සක්‍රිය සහ සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කිරීමෙන් පසු එළඹෙන සෑම වසරක් සඳහාම එක් වසරකට ලකුණු 10 බැගින් ද, මාස 06 කට නොඅඩු කාලයකට ලකුණු 05 බැගින් ද, මාස 03 කට නොඅඩු කාලයකට ලකුණු 2.5 බැගින් ද ලකුණු ලබා දෙනු ලැබේ.

**කුසලතාවය** **(උපරිම ලකුණු 30)**

I. නව්‍යතාවයන් හා නවෝත්පාදනයන් (Innovativeness and creativity) ලකුණු 10

ආයතනයේ ගුණාත්මකභාවය හා ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා අයදුම්කරු විසින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලද, එක් කාර්යයක් සඳහා ලකුණු 02 බැගින් කාර්යයන් 05 ක් සඳහා උපරිම ලකුණු 10 ක් ලබා දෙනු ලැබේ.

සටහන - (අ) අයදුම්කරුවන්ගේ පසුගිය වසර 05 ක කාර්ය සාධන වාර්තා පදනම් කරගෙන උක්ත කාර්යයන් හඳුනාගනු ලබයි.

(ආ) අයදුම්කරුවන් විසින් එම කාර්යයන් සාර්ථකව නිම කරන ලද බවට තහවුරු කෙරෙන ප්‍රදානයන්, ප්‍රශංසා හෝ සහතිකපත්‍ර සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළහොත් උක්ත කාර්යයන් සනාථ කිරීමට ඒවා ද ඉවහල් කරගනු ලැබේ.

II. ඉදිරිපත් කිරීම (Power Point Presentation) ලකුණු 20

විෂය ක්ෂේත්‍රයට අදාලව පරිගණකය ආශ්‍රයෙන් (Power Point) සිදු කරනු ලබන විනාඩි 15 ක ඉදිරිපත් කිරීමක්.

| | | |
|---|---|---|
| i. | අරමුණු හා දැක්ම (Objectives and Vision) | ලකුණු 05 |
| ii. | අදාළත්වය (Relevancy) | ලකුණු 05 |
| iii. | නිර්මාණශීලී බව (Creativity) | ලකුණු 05 |
| iv. | කාල කළමනාකරණය (Time Management) | ලකුණු 05 |

සටහන - (අ) මෙම ඉදිරිපත් කිරීමෙන් පසු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් විනාඩි 05 ක කාලයක් අයදුම්කරුගෙන් ප්‍රශ්න අසනු ලැබේ.

(ආ) ඉදිරිපත් කිරීමට අදාළ දෘඩ පිටපත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට එම අවස්ථාවේදී ඉදිරිපත් කල යුතුය. අමතර වශයෙන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකසන ලද ඉදිරිපත් කිරීමේ දෘඩ පිටපතක් ද මෙම අවස්ථාවේ දී ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.